**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - 2021**

---------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු පිරිවැය රු.550,059,778 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද එම වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර මෙම වත්කම්වල ඵලදායී ජීවිතකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරද නොතිබුණි. | පසුගිය කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මේ පිළිබඳ ක්‍රියාමාර්ග ගත නොහැකි වූ අතර, ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය ඉක්මවා තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් පිළිබඳ සමාලෝචනය සිදු කර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි පරිදි කටයුතු කිරීමට ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයෝජනවලට අදාල බැංකු වලින් කර තිබුණු ශේෂ සනාථ කිරීම් අනුව කාර්යාංශයේ ස්ථාවර තැන්පතු ආයෝජනය රු.2,641,230,569 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල එම ආයෝජනවල අගය රු.2,596,992,830 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.44,237,739 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේ වුවත් මෙම | 2021 වර්ෂයේදී ගිණුම් සකස් කිරීමේදී කාර්යාංශයට අයිති ස්ථාවර තැන්පතු පමණක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇති අතර කාර්යාංශයේ සේවකයන්ට හිමි බරපතල අසනීප අරමුදල් සහ සුනාමි හූ කම්පන මධ්‍යස්ථාන සඳහා විදේශියකින් ලද ආධාර මුදල | ආයෝජනවල වටිනාකම නිවැරදිව ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනසට හේතු සොයා බලා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරද නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් යටතේ දක්වා ඇත. | |
| (ආ) | 99 අවුරුදු බදු පදනමට ගත් ඉඩමක ඉදිකර තිබුණු ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය හා තොග ගබඩාව සඳහා 2018 සිට 2020 වර්ෂ දක්වා සංවර්ධන කටයුතු සඳහා දරා තිබුණ රු.8,193,693 ක වියදම ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස සමුච්චිත ලාභයට එරෙහිව කපා හැර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ සමුච්චිත ලාභය හා ගොඩනැගිලිවල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය සහ තොග ගබඩාව පවතින භූමිය කාර්යාංශය සතු නොවන අතර එය 99 අවුරුදු බදු පදනම මත බද්දට ලබා ගත් ඉඩමකි. නමුත් එහි පාර සකස් කිරීමට හා කානු පද්ධතිය සකස් කිරීම සඳහා සහ ඉඩම ප්‍රයෝජනයට ගත හැකි ආකාරයෙන් සකස් කිරීම සඳහා දරන ලද වියදම් බැවින් ප්‍රාග්ධනිත කිරීමක් සිදු නොකරන ලදි. | ප්‍රාග්ධන හා අයභාර වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයන්හිදී පල්ලෙකැලේ සුනාමි මධ්‍යස්ථාන නඩත්තුව සඳහා විදේශ විශ්ව විද්‍යාලයකින් කාර්යාංශයට ලැබී වියදම් දැරීමෙන් පසු ඉතිරිව තිබූ මුදල් ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ සඳහා නිවැරදි ගිණුම් ප්‍රතිපත්තියක් තෝරාගෙන ඒ අනුව ගිණුම්ගත කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රදාන ලැබීම් පිළිබඳ අනාවරණය කිරීමට කටයුතු කරන ලෙස ඉකුත් වර්ෂවල විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණි. එසේ වුවත් ඒ අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු රු. 1,824,809 ක් හා ස්ථාවර තැන්පතු සඳහා ලැබී තිබුණු ආයෝජන ආදායම් රු.359,498 ක් සහ වර්ෂය තුලදී ප්‍රදාන වලින් දරන ලද රු.2,591,292 ක වියදම් වෙනමම ගිණුමක සටහන් කර තිබුණද මෙම ආදායම් හා වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මෙම ස්ථාවර තැන්පතු මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් යටතේ දක්වා ඇත. මෙම විදේශ ආධාර මුදල ලැබී ඇත්තේ කාර්යාංශයේ කටයුතු සඳහා නොව සුනාමි සන්නිවේදන මධ්‍යස්ථානවල කටයුතු වෙනුවෙනි. | නිවැරදිව ගිණුම් ප්‍රතිපත්තියක් තෝරාගෙන ඒ අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කාර්යාංශයේ පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයෙන් සමාගමට ලැබිය යුතු හා සමාගමට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.4,698,378 ක් හා රු.1,513,857 ක් වූ අතර කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයට පරිපාලිත සමාගමෙන් ලැබිය යුතු හා | අදාළ ගණුදෙනුවලින් රු.3,267,161 ක ගණුදෙනු කාර්යංශය විසින් ගිණුම් ගත කර ඇත. කාර්යාංශයේ සහ ජීඑස්එම්බී තාක්ෂණික සේවා සමාගමේ ගිණුම්ගත නොවූ අන්තර් ගණුදෙනු සම්බන්ධයෙන් සාකච්ජා වට පැවැත්වූ අතර එම ගිණුම් පිළිබඳ | ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන පියවීමට හා අයකර ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| සමාගමට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.27,360,000 ක් හා රු.3,267,161 විය. ඒ අනුව පිළිවෙලින් රු.22,661,622 ක් හා 1,753,304 ක වෙනසක් නිරීක්ෂණය විය. සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාංශයෙන් සමාගමට හා සමාගමෙන් කාර්යාංශයට ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂවල ශුද්ධ අගය වූ රු.27,277,360 ක් අන්තර් සමාගම් යටතේ ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | තවදුරටත් සාකච්ඡා කිරීමට නියමිතව ඇත. එය ඉදිරියේ දී නිරාකරණය කිරීමට කටයුතු කරනු ලැබේ | යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | ඉකුත් වර්ෂයේ ජංගම නොවන වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණ වාර්තා 2022 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකළ අතර සමාලෝචිත වර්ෂයේ යක්කල ශාඛාවේ හා ප්‍රධාන කාර්යාලයේ විද්‍යාගාරවල භාණ්ඩ පමණක් සමීක්ෂණය කර තිබූ අතර කාර්යාංශයේ අනෙකුත් අංශවල භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයට අදාලව කාර්යාංශයේ යක්කල වැරැල්ලවත්ත ගබඩාවේ හා විද්‍යාගාරවලට අදාලව භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර ඇත. ඊට අදාල වාර්තා මේ සමග ඉදිරිපත් කරන අතර, ඉතිරි භාණ්ඩ සමීක්ෂණයන් රටේ වර්තමානයේ පවතින තත්වය හමුවේ තවදුරටත් සිදු කරමින් යන හෙයින් එම වාර්තාද ඉදිරියේදි ලබා දීමට කටයුතු කරන්නෙමු. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත | | | |
| (i) 26(1) හා 44(ආ) වගන්ති | රජය වෙනුවෙන් කාර්යාංශය අයකර ගත් රාජ්‍යභාගය භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත් 2016 සිට 2021 දක්වා කාලය තුල භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර කාර්යාංශයේ රඳවාගෙන තිබූ රාජ්‍යභාග වටිනාකම රු.මිලියන 3,147 ක් විය. | කාර්යාංශය විසින් මහා භාණ්ඩාගාරය වෙත රු.මිලියන 8,410,000,000 මුදලක් ප්‍රේෂණය කර ඇත. ඒ අනුව කාර්යාංශයට ලද මුළු රාජ්‍ය ආදායමෙන් මහා භාණ්ඩාගාරයට ගෙවීමෙන් පසු ඉතිරි වන්නේ රු.3,147,241,802 කි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 52(2) වගන්තිය හා 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 21(අ) වැනි පතල් හා කැණීම් නියෝගය | කැණීම්වලින් අනතුරුව මාස 2 සිට වර්ෂ 09 ක් දක්වා කාලය තුල ඉඩම් පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතු වුවද කැණීම් බලපත්‍රලාභීන් 1,943 දෙනෙකු ලවා එම කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඉහත බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන තිබූ වටිනාකම රු.439,004,539 ක් වූ බැංකු ඇපකර මුදල් කරගෙන තිබුණද එම මුදල් භූමි පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කාර්යාංශය විසින් පුනරුත්ථාපනය නොකරන ලද කැණීම් භූමි පුනරුත්ථාපනය කරවීම සඳහා කටයුතු සිදු කරමින් යන අතර, පුනරුත්ථාපනය නොකරන ලද කැණීම් ස්ථාන 100 කට ආසන්න ප්‍රමාණයක් සඳහා නීතිමය කටයුතු කිරීම සඳහා පියවර ගෙන ඇත. පුනරුත්ථාපන බැඳුම්කර සඳහා ලබාගෙන ඇති බැංකු ඇපකර වල වටිනාකම්, පුනරුත්ථාපනය කරවීම සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මේ වන විට කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පුනරුත්ථාපන බැඳුම්කර වල වටිනාකම ඉහළ දැමීමත් පුනරුත්ථාපන සැළැස්ම සැකසීම සම්බන්ධව මාර්ගෝපදේශ සංග්‍රහයක් අභ්‍යන්තර චක්‍රලේඛ මඟින් නිකුත් කොට ඇත. | පනත ප්‍රකාරව ඉඩම් පුනරුත්ථාපනය සඳහා එකතු කරන මුදල් ඒ සඳහා වැය කර ඉඩම් පුනරුත්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය. |
| | (iii) 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 33(4) වැනි පතල් කැණීම් නියෝග | පතල් නිෂ්පාදනවල නිශ්චය කළ වෙළඳ වටිනාකම, ඉඩදිය හැකි අඩු කිරීම් හා රාජ්‍යභාග ගෙවීම් වැඩපිළිවෙල සඳහා ලේකම්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර කාර්යයන් සම්බන්ධව කාලීන සංශෝධනයන් සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි. | රාජ්‍යභාග ප්‍රතිශතයන් වැඩි කිරීමක් හෝ අඩු කිරීමත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අත්සන් තබනු ලබන ආයෝජන ගිවිසුමක දී වෙනස් කිරීමට භාජනය කළ හැක. මෙම කටයුතු කාර්යාංශය විසින් ආයෝජන ගිවිසුම් අත්සන් තැබීමේ දී දැනටමත් සිදු කරමින් පවතින බව දන්වමි. | රාජ්‍ය භාග ගෙවීම් වැඩපිළිවෙල සඳහා ඉඩම් වටිනාකම් කාලීනව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත | | | |
| | (i) 2(ඉ) වගන්තිය | ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර | පවත්නා ඛනිජ ප්‍රතිපත්තිය අනුව කාර්යාංශය විසින් වටිනාකම් එකතු කිරීමකින් | ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීමේ |

| | | | | |
|---|---|---|---|---|
| | | කාර්යාංශය විසින් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් කැණීම් කරන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා ඛනිජ සඳහා අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස අපනයනය කෙරෙමින් පැවතුණි. | තොරව ඛනිජ අපනයනය සඳහා අවසර දෙනු නොලැබේ.<br>මේ වන විට අපනයනයට අනුමත කරනු ලබන ඇතැම් ඛනිජ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් හඳුනා ගෙන ඇති වටිනාකම් එකතු කිරීමේ සීමාවන්ට අනුකූලව ඛනිජ අපනයනය සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ. | වැඩපිළිවෙල කාර්යක්ෂමව හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 37(අ) (ආ) (ඇ) වගන්ති | කැණීම් බලපත්‍රයට අදාල යම් කොන්දේසියක් උල්ලංඝනය කිරීම, කාර්යාංශය විසින් දෙන ලද යම් නීත්‍යානුකූල විධානයක් ක්‍රියාත්මක කර නොමැති වීම, කාර්යාංශයේ අවසරයක් නොමැතිව මාස 03 කට වැඩි කාලයක් අත්හිටුවා ඇති බවට කාර්යාංශය සෑහීමකට පත් වන්නේනම් එම කැණීම් බලපත්‍ර අවලංගු කිරීමට කාර්යාංශයට බලය පැවරී ඇත. එසේ වුවද ඛනිජ වැලි කැණීම සඳහා 2017/2018 කාලය සඳහා වී.වී.එම් ලංකා මිනිරන් (පුද්) සමාගමට සහ 2014/2024 කාලය සඳහා ඇල්කෙමි හෙවි මෙට්ල්ස් (පුද්) සමාගමටත් ඛනිජ වැලි සඳහා ලබා දුන් කැණීම් බලපත්‍ර මගින් 2022 ජුනි 30 දින දක්වා කැණීම් කටයුත්තක් සිදුකර නොතිබූ අතර එම බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනය වෙතින් පෙන්වා දී ඇති පරිදි, වී.වී.එම්. ලංකා පෞද්ගලික සමාගම හා ඇල්කෙමි හෙවි මෙටල්ස් පෞද්ගලික සමාගම යන සමාගම් දෙක සඳහා පනත හා රෙගුලාසිවලට අනුකූලව කාර්යාංශය විසින් වර්ෂ 10 කට වලංගු වන පරිදි කැනීම් බලපත්‍ර නිකුත් කර ඇති අතර, කාර්යාංශය විසින් 2017 වර්ෂයේ දී ඇල්කෙමි හෙවි මෙටල්ස් පෞද්ගලික සමාගම වෙත නිකුත් කර ඇති කැනීම් බලපත්‍ර දෙක පනත හා රෙගුලාසි වලට අනුකූලව කාර්යාංශය විසින් අවලංගු කළ අතර, පනතේ ප්‍රකාරව බලපත්‍රලාභීන් විසින් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත කරනු ලබන අභියාචනයකින් අනතුරුව නැවත බලපත්‍ර වලංගුභාවයට පත් කිරීමට කාර්යාංශය විසින් කටයුතු කර ඇත. | කැණීම් කටයුතු නොකෙරුණු ආයතනවල බලපත්‍ර අවලංගු කර නැවත වෙනත් කැණීම් ආයතනවලට පැවරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14 දරන සහ 2017 නොවැම්බර් 17 දිනැති අංක | ශ්‍රී ලංකාව තුළ පතල් කැණීම් සිදුකරන සමාගමක මුළු කොටස් අයිතියෙන් විදේශීය අයිතිය සියයට 40 ක ප්‍රතිශතයක් දක්වා විය යුතු අතර එම සීමාව ඉක්මවා | ආයෝජන මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන තිබේ ද යන්න කාර්යාංශය විසින් මේ වන විට විමසීමක් සිදු කර ඇත.<br>ඒ අනුව, ඔවුන්ගෙන් ලබන | ගැසට් පත්‍රයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 2045/56 දරන අති විශේෂ ගැසට් පත්‍රවල සඳහන් විදේශ විනිමය නියෝග | විදේශීය අයිතිය පවතී නම් ලංකා ආයෝජන මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබාගත යුතු විය. නමුත් ශ්‍රී ලංකාව තුල මිනිරන් කැණීම් සිදුකරන බෝගල ග්‍රැපයිට් සමාගමේ මුළු කොටස් අයිතියෙන් සියයට 86.55 ක්ම විදේශීය සමාගම් 02 කට අයත් වූ අතර, මෙම සමාගම ලංකා ආයෝජන මණ්ඩලයෙන් එලෙස අනුමැතියක් ලබාගෙන හෝ එම මණ්ඩලය සමඟ ආයෝජන ගිවිසුමකට එළඹ නොතිබුණි. මේ පිළිබඳ නොසලකා මෙම සමාගමට මිනිරන් කැණීම් සඳහා කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර 02ක් නිකුත් කර තිබුණි. | තොරතුරු මත ඉදිරියේ දී කාර්යාංශය විසින් ආයෝජන මණ්ඩලයේ අවසරය ලබා ගැනීම සඳහා කටයුතු කරනු ඇත. | |
| (ඉ) | 2017 මාර්තු 29 දිනැති අංක අමප/17/530/704 /009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රජයේ සංවර්ධන කටයුතු සඳහා මහවැලි අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන ගංගා සහ ගංගා ද්‍රෝණිවල පවතින ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීමේදී එම ප්‍රදේශවල පුළුල් පාරිසරික බලපෑම් ඇගයීමක් කර අසීමාන්තිකව එම ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීම නිසා පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමේ වැදගත්කම ද සැලකිල්ලට ගෙන කාර්යාංශය විසින් ජීඑස්එම්බී තාක්ෂණ සේවා(පුද්) සමාගමට පමණක් කැණීම් බලපත්‍ර ලබාදිය යුතු බව සඳහන් වේ. කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ එම සමාගමට අමතරව පෞද්ගලික බලපත්‍රලාභීන් 82 ක් වෙත මහවැලි අධිකාරියට අයත් | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මහවැලි ගඟේ, මනම්පිටිය ප්‍රදේශයේ වනජීවී කලාපය තුළ ඇති නිධිගත වැලි නිධි ඉවත් කිරීම සඳහා අංක 81/2004 දරන ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවෙන් ලද නියෝග මත ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා (පුද්.) ආයතනය වෙත වැලි කැනීම සඳහා 2008 වර්ෂයේ සිට කාර්යාංශය විසින් බලපත්‍ර නිකුත් කරන ලදී. මනම්පිටිය හැරුණුවිට පොළොන්නරු දිස්ත්‍රික්කයේ මහවැලි ගඟේ හා මාදුරු ඔය ආශ්‍රිත වැලි කැනීම් බලපත්‍ර සෙසු පුද්ගලයින් වෙත වැලි කැනීම සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී. ඒ අනුව, ඉඩමේ හිමිකාරීත්වය දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුමැතිය මත වෙනත් පුද්ගලයින් වෙත වැලි කැනීම සඳහා බලපත්‍ර | අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | මාදුරුඔයෙහි වැලි කැණීම් කිරීම සඳහා බලපත්‍ර ලබාදී තිබුණි. | නිකුත් කිරීම නීතිමය වශයෙන් ගැටළුවක් නොවන බව දන්වමු. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,564,466,354 ක ලාභය ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.730,394,526 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.834,071,758 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කාර්යාංශයේ හා පරිපාලිතයේ ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී භාණ්ඩාගාර ලේකම් සහ ජර්මන් සමාගමක් අතර ඇතිකරගත් ගිවිසුමක් අනුව බෝගල ග්‍රැපයිට් සමාගමෙන් රජය සතු කොටස් සියයට 50.01 ක් එකී ජර්මන් සමාගමට පවරා තිබු අතර මෙම ගිවිසුම ප්‍රකාරව මිලදී ගන්නා සමාගම ශ්‍රී ලංකාව තුල මිනිරන් පදනම් කරගත් කර්මාන්ත සංවර්ධනය සහ අලෙවිය සිදුකිරීමට අදාළ යෝජනා රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිසමට භාරදීමටත් එකඟ වී තිබුණි. නමුත්, සමාගම විසින් මිනිරන් පදනම් කරගත් කර්මාන්ත සංවර්ධනයක් ශ්‍රී ලංකාව තුල සිදුකර නොතිබු අතර සමාගම විසින් කැණීම් කරන මිනිරන් අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස තවදුරටත් අපනයනය කරමින් පැවතුණි. | බෝගල ග්‍රෑෆයිට් සමාගම යටතේ නිකුත් කරනු ලබන කැනීම් බලපත්‍ර යටතේ පොළව මතුපිට සිට අඩි 1,000 ඉක්මවූ ගැඹුරක සිට විශාල ප්‍රාග්ධන වියදමක් යොදමින් සිදුකරනු ලබන කැනීම් වලින් අනතුරුව පොළව මතුපිටට ගෙන එන ඛනිජ නැවත පිරිසැකසුම් කිරීමකට ලක්කර අපනයනය සඳහා සැකසීම් සිදු කරනු ලැබේ. ඒ අනුව, ඛනිජයක වටිනාකමක් එකතු කිරීම සඳහා බෝගල ග්‍රෑෆයිට් සමාගම ඇතුළු සියළුම මිනිරන් කැනීම් බලපත්‍රලාභීන් විශාල ආයෝජනයක් සිදු කරනු ලබයි. ඒ අනුව, මේ වනවිට මිනිරන් ඛනිජය කාර්යාංශය විසින් හඳුනාගත් වටිනාකම් එකතු කිරීමකට අනුකූලව අපනයනය සිදුකරන මුත්, ඉදිරියේ දී ඒ සඳහා නව වටිනාකම් එකතු කිරීමේ සීමාවන් හඳුන්වා දීමටත්, එම සීමාවන්ට අනුව අපනයනය සඳහා අවසර දීමටත් කටයුතු කිරීමට කාර්යාංශය අවශ්‍ය මූලික කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී. | කාර්යාංශය මේ සම්බන්ධයෙන් කඩිනමින් නිසි නියාමනයක් සිදුකළ යුතුය. |
| (ආ) | කහටගහ ග්‍රැපයිට් සමාගම කැණීම් සිදුකරන කහටගහ පතලෙහි, කාර්යාංශය විසින් වාර්ෂිකව සහ විශේෂ අවස්ථාවල සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී එහි පවතින අඩුපාඩු පිළිබඳව | මෙම මිනිරන් පතල සඳහා නිකුත් කර ඇති කැනීම් බලපත්‍රය වාර්ෂිකව දීර්ඝ කරනු ලබන අතර, එම පතලේ පවතින අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කාර්යාංශය විසින් කොන්දේසි පනවා ඇති අතර, වාර්ෂිකව අළුත් කිරීමේ දී | ක්ෂේත්‍ර පරීක්ෂණවලදී හඳුනාගත් අඩුපාඩු නිවැරදි කර තිබේද |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂණ වාර්තා මගින් නිරන්තරව දැනුම් දෙමින් කැණීම් බලපත්‍ර වාර්ෂිකව දීර්ඝ කර තිබූ අතර අදාල සමාගම මගින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට පියවර ගෙන නොතිබූ බව පරීක්ෂණ වාර්තා වලින් තහවුරු විය. | එහි කොන්දේසි මගින් දී ඇති උපදෙස් අනුගමනය කර තිබේ ද යන්න අධීක්ෂණය කරනු ලැබේ. | යන්න අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල කාර්යාංශයේ කැණීම් ඉංජිනේරුවන් සහ භූ විද්‍යාඥයන්ගෙන් සැදුම්ලත් තාක්ෂණික කණ්ඩායමක් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයකින් සහ කමිටු රැස්වීමකින් අනතුරුව සකුරා ග්‍රැෆයිට් සමාගම සඳහා වූ කැණීම් බලපත්‍රය වර්ෂයකින් පමණක් දීර්ඝ කිරීමට එම කමිටුවේ අධ්‍යක්ෂ(පාරිසරික බලපෑම් ඇගයීම් හා ප්‍රාදේශීය) විසින් නිර්දේශ කර තිබියදී අදාල බලපත්‍රය 2021 සිට 2031 දක්වා වර්ෂ 10 කින් දීර්ඝ කිරීමට කාර්යාංශය විසින් පියවර ගෙන තිබූ අතර මේ සඳහා කාර්යාංශය පිහිටුවීම් පනත මගින් හෝ වෙනත් අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් මේ සඳහා විශේෂ බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. | පනත හා රෙගුලාසි යටතේ පවරා ඇති නීතිරීති වලට අනුව කාර්මික කැනීම් "ඒ" කාණ්ඩයේ බලපත්‍රයක වලංගු කාලය කාර්යාංශයේ අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කර ඇති ආර්ථික ජීව්‍යතා වාර්තා පදනම් කොටගෙන තීරණය කළ හැක.<br>ඒ අනුව, ඉදිරිපත් කර ඇති ආර්ථික ජීව්‍යතා වාර්තාව පදනම් කරගෙන අයදුම්කරු විසින් පනත හා රෙගුලාසි වලට අනුකූලව කරන ලද ඉල්ලීම මත අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බැවින් කාර්යාංශය විසින් වර්ෂ 10 ක කාලයකට බලපත්‍රය නිකුත් කර ඇත. | කාර්යාංශය පිහිටුවීම් පනත මගින් හෝ වෙනත් අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් විශේෂ බලතල පැවරීමක් සිදුකර නොමැති කාර්යයන් සඳහා අනුමැතිය ලබා නොදිය යුතුය. |
| (ඈ) | කරස්නාගල මිනිරන් පතලේ කැණීම් කටයුතු සර්කෝන් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම විසින් සිදුකරන අතර එහි සම්පූර්ණ අයිතිය විදේශිය පාර්ශවයන් වෙත පවතින නිසා ශ්‍රී ලංකාවේ මිනිරන් ගවේෂණය, කැණීම හා දේශීය වෙළඳපල හා විදේශීය වෙළඳපල වෙත අලෙවි කිරීම සඳහා එකී සමාගම 2012 වර්ෂයේදි ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ගත වී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාල වැඩ කටයුතු ඉටුවී නොතිබූ නිසා එම ගිවිසුම්වල වලංගු කාලය 2018 වර්ෂය දක්වා දීර්ඝ කර තිබූ අතර එම ගිවිසුම්වල වලංගු භාවය පිළිබඳ තවදුරටත් පරීක්ෂා කිරීමකින් තොරව මෙම පතල සඳහා 2019 අගෝස්තු 26 දින සිට 2022 පෙබරවාරි 28 දින දක්වා අවස්ථා 02 කදි කැනීම් බලපත්‍ර නිකුත් කර තිබුණි. 2019-2021 කාලය තුල මෙම මිනිරන් පතලෙහි මිනිරන් කැණීම් | අපේක්ෂිත ඛනිජ නිෂ්පාදනයන් සිදු කිරීමට මිනිරන් කැනීම් බලපත්‍රය යටතේ නොහැකි වන අවස්ථා පවතී.<br>ඒ අනුව, මෙම සමාගම ද මේ වන විට කණිනු ලබන මිනිරන් වලින් ටොන් 01 ක ප්‍රමාණයක් පමණක් මේ වන විට අපනයනය සිදු කර ඇත.<br>කෙසේ වෙතත්, වර්තමානයේ ආයෝජකයින් අතර පවතින නෛතික ගැටළුවක් මත කැනීම් බලපත්‍රයේ වැඩ කටයුතු අවම මට්ටමකින් සිදු කරමින් පවතී. | ගිවිසුම්වල වලංගුභාවය පිළිබඳ පරීක්ෂා කළ යුතු අතර කාර්යාංශය නිසි නියාමනයක් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණවත් පරිදි සිදුකර නොතිබූ අතර 2020 වර්ෂයේදී මිනිරන් ටොන් 01 ක් පමණක් විදේශ රටකට අමුද්‍රව්‍ය ලෙස අපනයනය කර තිබුණි. | | |
| (ඉ) | 1991 වර්ෂයේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රකාශිත දැනට භාවිතයේ පවතින ජාතික ඛනිජ ප්‍රතිපත්තිය අනුව පවතින ඛනිජ පාදක කරගත් කර්මාන්ත සඳහා අගය එකතු කිරීම සිදුකල යුතු වුවත් බෝගල ග්‍රැපයිට්, කහටගහ ග්‍රැපයිට්, කරස්නාගල සහ සකුරා ග්‍රැපයිට් යන සමාගම් 4 විසින් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල අගය එකතු කිරීමකින් තොරව මිනිරන් කිලෝග්‍රෑම් 1 ක් රු.282 ත් රු.415 ත් අතර මිලකට කිලෝ ග්‍රෑම් 7,632,000 ක් රු.මි.2,708 ක වටිනාකමකට අපනයනය කර තිබුණි. | පොළව මතුපිටට ගෙන එන ඛනිජ නැවත පිරිසැකසුම් කිරීමකට ලක්කර අපනයනය සඳහා සැකසීම් සිදු කරනු ලැබේ.<br>මේ අනුව, මූලික අගය එකතු කිරීමක් ඛනිජ අපනයනයේ දී බලපත්‍රලාභීන් විසින් සිදු කර ඇති අතර, කාර්යාංශය විසින් මිනිරන් සඳහා අගය එකතු කිරීමේ සීමාවන් හඳුන්වා දීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. | මිනිරන් ඉතා අඩු මුදලකට අපනයනය කිරීම වෙනුවට තාක්ෂණය භාවිත කර නිමි හෝ අර්ධ නිමි නිෂ්පාදනයන් සකස් කර අපනයනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | මන්නාරම දිස්ත්‍රික්කයේ ඛනිජ වැලි කැණීම හා අගය එකතු කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ වී.වී.එම් ලංකා මිනිරන් (පුද්) සමාගම අතර 2012 වර්ෂයේදි ආයෝජන ගිවිසුමකට එළඹ තිබූ අතර එම ව්‍යාපෘතිය සිදු නොකිරීම නිසා අදාල ගිවිසුම 2020 පෙබරවාරි 25 දින ලංකා ආයෝජන මණ්ඩලය මගින් අවලංගු කර තිබුණි. මෙම ගිවිසුම් පරීක්ෂා කිරීමකින් තොරව කාර්යාංශය විසින් ත්‍රිකුණාමලය මුතූර් ප්‍රදේශයේ ඛනිජ වැලි කැණීම සඳහා 2017 සිට 2018 වර්ෂය දක්වාද, 2018 ජුලි 12 සිට 2028 ජුලි 11 දක්වා වර්ෂ 10 කටද බලපත්‍රයක් ලබාදී තිබුණි. නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක්ම කිසිදු කැණීමක් සිදුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ අළුතින් ලියාපදිංචි කරන ලද සමාගමකට මෙම බලපත්‍රය පැවරීමට කටයුතු කරමින් පැවතුණි. | පනත හා රෙගුලාසි යටතේ කාර්මික කැනීම් ඒ හා බී කාණ්ඩයේ බලපත්‍රයක් නීතිමය වශයෙන් පැවරීමට නීති සැකසී ඇත. ඒ අනුව, ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර හා තාක්ෂණික කරුණු, ගිවිසුම් පදනම්කොට ගෙන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යටත්ව පැවරීම සිදුකර ඇත. | ගිවිසුම් පරීක්ෂා කිරීමෙන් තොරව බලපත්‍ර ලබා නොදිය යුතු අතර කැණීම් නොකරන බලපත්‍ර අවළංගු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වී.වී.එම්. ලංකා මිනරල් සමාගමට සහ ඇල්කෙමි හෙවි මෙටල් සමාගමට පිළිවෙළින් 2018 ඔක්තෝබර් 23 දිනෙන් පසුව හා 2017 දෙසැම්බර් 20 දිනෙන් පසුව අදාල වෙරළ තීරයන්හි ඛනිජ වැලි කැණීමට බලපත්‍ර ලබාදී නොතිබුණ නමුත් කාර්යාංශය වර්ෂ 10 ක් සඳහා මෙම සමාගම වෙත බලපත්‍ර ලබා දී තිබුණි. | මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යානය මත වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය නිකුත් කරනු ලබන අතර, බලපත්‍රලාභියා විසින් අදාළ නිර්දේශ මත බලපත්‍රයෙන් පැවරී ඇති කාර්යයන් සිදු කළ යුතු වේ. | වෙරළ තීරයන්හි ඛනිජ වැලි කැණීමට බලපත්‍ර ලබා දීමේදී නිසි අනුමැතියක් ලබා ගැනීම පිළිබඳ අවධානය යොමුකළ යුතුය. |
| (ඌ) | 2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම් දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනිමට 2022 ජුනි 30 දක්වා කටයුතු කර නොතිබුණි. | 1999 එවකට කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ජාතික ඛනිජ ප්‍රතිපත්තියට අනුව මේ වන විට කාර්යාංශය විසින් කටයුතු කරමින් සිටින අතර, එම ප්‍රතිපත්තිය වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කොට මේ වන විට එය පරිසර අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. මේ පිළිබඳව පරිසර අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඉදිරි මාස 06 ක කාලය ඇතුළත නව ප්‍රතිපත්තිය එළිදැක්වීම සඳහා කටයුතු කිරීමට කාර්යාංශය විසින් සාකච්ඡා කරමින් පවතී. | ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් කඩිනමින් සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. |
| (එ) | කළුගල් කැණිම් ප්‍රමාණය හඳුනා ගැනිමට විද්‍යාත්මක ක්‍රමවේදයක් මෙතෙක් අනුගමනය කර නොතිබුණු අතර කළුගල් කැණීම සඳහා යොදා ගන්නා පුපුරන ද්‍රව්‍ය මෙන් දෙගුණයක් කැණිම් කළ කියුබ් ප්‍රමාණය ලෙස සලකා පදනමකින් තොරව රාජ්‍යභාග අයකර ගනිමින් පැවතුණි. | භාවිතා කරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය මත සිදු කරන ඉවත් වූ ඛනිජ ප්‍රමාණය පිළිබඳ ගණනය කිරීමේ දී ඒ තුළින් දක්නට ඇති ගැටළුව වන්නේ, ලබාගත් මුළු පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණයම එම කැණීම් සඳහා භාවිතා කළේ ද නැතිනම්, වෙනත් ස්ථානයක කැණීම් සඳහා භාවිතා කළේ ද යන්න පැහැදිලිතාවක් හඳුනා ගැනීමට නොහැකි වීමයි. එම ගැටළුව මඟහැරවීම සඳහා වරින් වර කණිනු ලබන කළුගල් ප්‍රමාණය හා භාවිතා කළ පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය සංසන්දනය කිරීම සඳහා අහඹු ලෙස පරීක්ෂා කිරීමට මේ වන විට කටයුතු කර ඇත. | විද්‍යාත්මක ක්‍රමවේදයක් කඩිනමින් සකස් කළ යුතුය. |
| (ඒ) | යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා 2016-2018 කාලපරිච්ඡේදය තුල භාවිත කල පස් කියුබ් 1,343,810 ක් හා වැලි කියුබ් 3,397 ක් සඳහා පිළිවෙලින් ලැබිය යුතු රු.26,876, 200 ක් සහ රු.543,490 ක් බැගින් එකතුව වූ රු.27,419,690 ක රාජ්‍යභාගය සමාලෝචිත වර්ෂය අවසානය වන | කාර්යාංශය විසින් අදාළ රාජ්‍යභාගය ගෙවන ලෙසට යාන්ඔය ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවූ චීන සමාගමට හා ව්‍යාපෘතියේ හිමිකාරීත්වය දරන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත රාජ්‍යභාගය ගෙවන ලෙසට දන්වා සිටිය ද, මෙතෙක් ඔවුන් විසින් එම ගෙවීම් සිදු කිරීමට කටයුතු කර නොමැත. කෙසේ වෙතත්, කාර්යාංශය විසින් වාරිමාර්ග | මෙම හිඟ මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විටත් අදාල කොන්ත්‍රාත් සමාගමෙන් අයකරගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව සමඟ කරන ලද සාකාච්ඡාවකට අනුව මේ පිළිබඳව කාර්යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අතර තවදුරටත් සාකච්ඡා කළ යුතු බවට දන්වා ඇති බැවින්, ඒ පිළිබඳව ඉදිරියේ දී දෙපාර්ශවය අතර සාකච්ඡාවක් පැවැත්වීමට යෝජිතය. | |
| (ඔ) | පෞද්ගලික බලපත්‍රලාභීන් 82 ක් වෙත මහවැලි අධිකාරියට අයත් මාදුරු ඔයෙහි වැලි කැණීම සඳහා මාසික ධාරිතාවය කියුබ් 100 කැණීම් බලපත්‍ර නිකුත් කර තිබූ අතර ඒ මගින් සතියේ දින 03 ක් පමණක් කැණීම් කිරීමට අවසර ලබාදී තිබුණි. නමුත් බලපත්‍රලාභීන් පරිසර අධිකාරියේ සහ කාර්යාංශය නිකුත් කර ඇති කැණීම් කොන්දේසි කඩකරමින් කරන මාසික ධාරිතාවය වූ කියුබ් 100 ඉක්මවමින් සතියේ දින 07 ම කැණීම් කරමින් පැවති අතර කාර්යාංශය විසින් මේ සම්බන්ධව නිසි නියාමනයක් සිදුකර නොතිබුණි. | පොළොන්නරු දිස්ත්‍රික්කයේ, මහවැලි ගඟේ වැලි කැනීම් සඳහා පෞද්ගලික බලපත්‍රලාභීන් 82 ක් වෙත මසකට වැලි කියුබ් 100 බැගින් කැනීම් කිරීමටත්, එම කැනීම් කටයුතු සතියේ සඳුදා, බදාදා හා සිකුරාදා දිනවල පමණක් සිදු කරන ලෙසත් කොන්දේසි පනවා කැනීම් බලපත්‍ර නිකුත් කර ඇත.<br>එම කොන්දේසි උල්ලංඝණය කරමින් කැනීම් කරන බවට කාර්යාංශය වෙත ලැබුණු පැමිණිලිවලට අනුව කාර්යාංශයේ වැටලීම් අංශය විසින් වැටලීම් කිහිපයක් සිදු කර ඇත.<br>ඊට අමතරව පනත හා රෙගුලසි යටතේ අනවසර ක්‍රියා වැළක්වීම සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට ද නීතිය ක්‍රියාත්මක කිරීමට බලතල හිමිවී ඇති බැවින්, මේ සම්බන්ධව වැටලීම් කිරීමට කාර්යාංශය විසින් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත.<br>ඊට අමතරව විශේෂ කාර්ය බලකායට ද කැනීම් බලපත්‍ර සම්බන්ධ වැටලීම් සිදු කිරීමට කාර්යාංශය විසින් උපදෙස් දී ඇත. | කාර්යාංශය විසින් නිසි නියාමනයක් සිදුකළ යුතුය. |
| (ඕ) | කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතිය සඳහා කාර්යාංශය විසින් නිකුත් කල IML/A/HO/13015 දරන කැණීම් බලපත්‍රයේ කැණීම් කිරීමට අනුමත ප්‍රදේශය හෙක්ටයාර 01 ක් ලෙස දක්වා තිබුණත් කැණීම් කල A නැමැති වැලි නිධිය හෙක්ටයාර 06-07 ක ප්‍රදේශයක පැතිර පැවතුණි. එමෙන්ම කැණීම් බලපත්‍රයේ මාසිකව කැණීම් කල හැකි උපරිම ධාරිතාවය සඳහන්ව නොමැති බවත්, කැණීම් කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතා කල හැකි ද යන්න සහ භාවිතා කල හැකි යන්ත්‍ර සූත්‍ර මොනවාද යන්න වැලි නිධියේ කැණීම් කල හැකි මට්ටම සහ කැණීම් කල යුතු ප්‍රදේශයේ නිවැරදි GPS ඛණ්ඩාංක සඳහන්ව නොමැති | කන්තලේ-සූරියපුර මහවැලි ගඟේ ගං ඉවුරට සිදුවන හානි වැළැක්වීම සඳහා වේල්ලක් ඉදිකිරීම මූලික කර ගෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශවලට යටත්ව ගං ඉවුරට හානි වන පරිදි තැන්පත් වී ඇති වැලි නිධිය ඉවත් කිරීම සඳහා කාර්යාංශය මඟින් ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා (පුද්.) ආයතනය වෙත අංක IML/A/HO/13015 දරන කාර්මික කැනීම් බලපත්‍රය නිකුත් කර ඇත.<br>මෙය මූලික වශයෙන්ම ගං ඉවුරට හානි කරන වැලි නිධි ඉවත් කර, හානියට පත් වූ ගං ඉවුරේ වේල්ලක් ඉදිකිරීම මුල්කොට ගෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත | කැණීම් පිළිබඳ අධීක්ෂණය හා බලපත්‍රයේ අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

බවත් කැණීම් කටයුතු කාර්යාංශය මගින් හෝ තුන්වන වන පාර්ශවයක් මගින් පූර්ණ අධීක්ෂණයකට ලක් කිරීම සුදුසු වන බවට කාර්යාංශයේ කැණීම් ඉංජිනේරුවරයකු විසින්ම නිකුත් කල වාර්තාවක දක්වා තිබුණි. නමුත්, සමාලෝචිත වර්ෂයේදී එම කැණීම් පිළිබඳ අධීක්ෂණය සහ කැණීම් බලපත්‍රයේ සඳහන් ඉහත අඩුපාඩු කාර්යාංශය විසින් නිවැරදි කර නොතිබුණි . නිකුත් කරන ලද්දක් බැවින්, මෙහි අධීක්ෂණ කටයුතු එම ආයතන වලින් සිදු කිරීම කළ යුතු වේ.